(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

**අංක 1(12).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 අප්‍රේල් 29 සිකුරාදා**

**2022 මැයි 17 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2044/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත කාලය තුළදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස ගම්මාන අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති නිවාස ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනතෙක් වැඩ අවසන් කර නොමැති නිවාස ගම්මාන තිබේ නම්, ඒවායේ නම් කවරේද;

(v) එම නිවාස ගම්මානවල වැඩ අවසන් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2019 සිට මේ වනතෙක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති හා මේ වනවිට ඉදිකරමින් පවතින නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2060/2022

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,—මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා මහාමාර්ග විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයසස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා හා ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2072/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඔවුන්ට එරෙහිව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2085/2022

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තෙතමනය 14% ට වඩා අඩු වී මිලදී ගැනීම හේතුවෙන් වී අලෙවි මණ්ඩලයට අලාභයක් සිදු නොවන්නේද;

(ii) තෙතමනය සහිත වී කිලෝග්‍රෑම් එකක ගැනුම් මිල කොපමණද;

(iii) වියළි වී කිලෝග්‍රෑම් එකක් සකස් කර ගැනීමට අවශ්‍ය වන තෙත වී ප්‍රමාණය කොපමණද;

(iv) තෙතමනය සහිත වී වියළීම සඳහා කුඩා පරිමාණ හාල් මෝල්හිමියන්ට ලබා දෙන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා කිලෝග්‍රෑම් එකකට ගෙවනු ලබන මිල කොපමණද;

(vi) එසේ ලබා දෙන වී කිලෝග්‍රෑම් එකක ප්‍රවාහනය සඳහා ගෙවනු ලබන මිල කොපමණද;

(vii) ඒ අනුව වියළි වී කිලෝ ග්‍රෑම් එකක් සකස් කර ගැනීම සඳහා වැය වන මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2095/2022

ගරු අජිත් රාජපක්ෂ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ II වැනි පරිච්ඡේදයේ 12:1හි විධිවිධානවලින් බැහැරව/අභිබවා කටයුතු කිරීමට නෛතික බලයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ලිඛිත නීතිය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XXV වැනි පරිච්ඡේදයේ 4:1 සහ 2009.02.20 අංක 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ 146 වගන්තියේ VI උප වගන්තිය අනුව 2021.09.30 දින වනවිට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් අතරින් වෘත්තීය සමිති කටයුතුවලට පූර්ණකාලීනව නිදහස් කර ඇති නිලධාරීන් සංඛ්‍යාව, එම එක් එක් නිලධාරියාගේ නම, නිදහස් කළ දිනය, එම අවස්ථාවේ තනතුර සහ රාජකාරි ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2113/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අලි-මිනිස් ගැටුම් හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ මරණයට පත්වන එක් පුද්ගලයෙකු වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදල කොපමණද;

(iii) අලි-මිනිස් ගැටුම් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2261/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවයට අලුතින් බඳවාගන්නා ලද අභ්‍යාසලාභී උපාධිධාරීන්ට ප්‍රසූත නිවාඩු ලබා නොදීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එම තීරණය හේතුවෙන් ඔවුන්ට බලවත් අසාධාරණයක් සිදු වී තිබෙන බව පිළිගන්නේද;

(iii) ඉහත තීරණය ඉවත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2457/2022

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ මේ දක්වා ශ්‍රී ලංකාවට පැමිණ ඇති විදේශීය සංචාරකයන් සංඛ්‍යාව;

(ii) 2022 වර්ෂයේදී පැමිණෙතැයි අපේක්ෂා කරනු ලබන සංඛ්‍යාව;

(iii) විදේශීය සංචාරකයන් මගින් 2022 වර්ෂයේදී උපයා ගැනීමට අපේක්ෂිත ආදායම;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2565/2022

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට වැවිලි සමාගම් විසින් කළමනාකරණය කරනු ලබන ශ්‍රී ලංකාවේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල ඉඩම් අයිතිය රජය සතුව තිබේද;

(iii) නොඑසේ නම්, එම ඉඩම්වල අයිතිය රජයෙන් බැහැර කර සම්පූර්ණයෙන්ම වතු සමාගම් වෙත පවරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වතුවල ජීවත්වන ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමේදී අදාළ වතු සමාගම්වලින් අවසර ලබා ගත යුතු වන්නේද;

(ii) විශේෂයෙන්ම වතු නිවාස සඳහා පානීය ජල පහසුකම් හා විදුලිය ලබා ගැනීමේදී සහ නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් ලබා ගැනීමේදී අදාළ වතු සමාගම්වලින් අවසර ලබා ගත යුතු වන්නේද;

(iii) එම තත්ත්වය, රජයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බාධාවක් බව දන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා සුදුසු පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2569/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින හීලෑ අලි-ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම හීලෑ අලි-ඇතුන් හිමි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් පුද්ගලයාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හීලෑ අලි-ඇතුන්ගේ සුබසාධනය වෙනුවෙන් මේ දක්වා විධිමත් වැඩසටහනක් හෝ නීති රීති පද්ධතියක් සකස් කර නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 මැයි 18 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2633/2022

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ගෑස් පිළිබඳව සමාජ කතිකාවතක් නිර්මාණය වී ඇති බව දන්නේද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වෙළඳපොළට ගෘහස්ථ ගෑස් සපයන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමාගම් කවරේද;

(iv) එම එක් එක් සමාගමේ වෙළඳපොළ පංගුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සමාගම් විසින් සපයනු ලබන ගෑස්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීමට හෝ නියාමනය කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව දන්නේද;

(ii) ගෑස්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ වගකීම පැවරී ඇති ආයතන සංඛ්‍යාව හා එම ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ගෑස්වල ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා ඉහත සඳහන් ආයතන ශක්තිමත් කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2650/2022

ගරු රවුෆ් හකීම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යයන වර්ෂ 2016-2018 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් සඳහා 2021 ජනවාරි මස 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ආ) ශ්‍රේණියට පත්වීම් ලබාදීමේදී, ඉස්ලාම් ආගම විෂය ඉගැන්වීම සඳහා පත්වීම් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් පත්වීම්ලාභියාගේ නම, ලිපිනය සහ අනුයුක්ත කරන ලද පාසල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2653/2022

ගරු මයන්ත දිසානායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ණය ලබා ගෙන ඇති රාජ්‍ය ආයතන සහ බැංකු කවරේද;

(ii) එක් එක් වර්ෂය අනුව වර්ෂ 2010 සිට මේ දක්වා එම සංස්ථාවේ ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංස්ථාව රාජ්‍ය ආයතනවලට ලබා දී ඇති ඉන්ධන සඳහා මුදල් අයවීමට තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ආයතනයේ නම සහ අයවිය යුතු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2688/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන පහසුකම් පුළුල් කිරීමේ අරමුණින් පසුගිය රජයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ග්‍රාමීය මට්ටමෙන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) මේ යටතේ වර්ෂ 2016 සිට 2019 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද එක් එක් පාලම් ව්‍යාපෘතියේ නම, එය අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල, ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරන ලද දිනය සහ එහි වර්තමාන ප්‍රගතිය කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිරියේදී පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ නම්, එම එක් එක් පාලම් ව්‍යාපෘතියේ නම, එය අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම, එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල, එහි වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිත කාල වකවානුව කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2749/2022

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික්කවල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආරම්භ කරන ලද කිවුල් ඔය ව්‍යාපෘතිය සඳහා වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික් සංවර්ධන කමිටුවල අනුමතිය ලබා දී තිබේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එළිපෙහෙළි කිරීමට අපේක්ෂා කරනු ලබන වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(iv) එම මුදල, දේශීය අරමුදල් මඟින් සපයාගනු ලබන්නේද;

(v) නොඑසේ නම්, එය විදේශ ආධාරයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී ප්‍රදේශය නියෝජනය කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ අදහස් ලබා නොගැනීමට හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන්නි දිස්ත්‍රික්කය නියෝජනය කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අකමැත්තක් දක්වන්නේ නම්, එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2767/2022

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනවසරයෙන් රජයේ ඉඩම් අත්පත් කරගෙන සංවර්ධනය කර ඇති පුද්ගලයන් වෙත නෛතික ලියවිලි නිකුත් කිරීම කඩිනම් කරනු පිණිස 2020.09.10 දින නිකුත් කරන ලද අංක 2192/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, ඉන් දින 12කට පසු එනම්, 2020.09.22 දින නිකුත් කරන ලද අංක 2194/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අහෝසි කරනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020.09.10 දිනැති අංක 2192/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ලැබී ඇති ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉල්ලුම්පත්‍ර අතරින් සලකා බලන ලද ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) 2020.09.10 සිට 2020.09.22 දක්වා නිකුත් කරන ලද ඔප්පු, බලපත්‍ර හා වෙනත් නෛතික ලියවිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් ඔප්පු, බලපත්‍ර හා වෙනත් නෛතික ලියවිලි නිකුත් කරන ලද එක් එක් ප්‍රතිලාභියාගේ නම, ලිපිනය හා වෙන් කර දෙන ලද ඉඩම් කොටසේ විශාලත්වය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2768/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 වර්ෂයේදී බස්නාහිර පළාතේ, ආදායම් පරීක්ෂක තනතුර සඳහා බඳවාගන්නා ලද ක්‍රමවේද;

(ii) එම එක් එක් ක්‍රමවේදය සඳහා අවශ්‍ය වූ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන්;

(iii) 2015 වර්ෂයෙන් පසු, අංක 06/2006 දරන චක්‍රලේඛය අනුව බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක තනතුර සඳහා බඳවා ගන්නා ලද ක්‍රමවේදය;

(iv) ඒ සඳහා අවශ්‍ය වූ අධ්‍යාපන සුදුසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අංක 06/2006 චක්‍රලේඛය අනුව 2004 වර්ෂයේදී බඳවාගන්නා ලද ආදායම් පරීක්ෂකවරුන්ගේ වැටුප් අඩුවීමක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එය නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2770/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානයේ (සාර්ක් - SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙට්‍රික් ටොන් 8000 ක විශේෂිත සහල් සංචිතයක් සහ 2008 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙට්‍රික් ටොන් 100,000ක ආරක්ෂිත සහල් සංචිතයක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගත යුතු වුවත්, 2020 වර්ෂයේදී ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් කිසිදු සහල් සංචිතයක් පවත්වා ගෙන නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඉහත (අ) (i) හි සඳහන් පරිදි සහල් සංචිත පවත්වා ගත්තේ නම්, පුද්ගලික අංශයේ සහල් ඒකාධිකාරය බිඳ හෙළමින් සහල් සඳහා සමතුලිත මිලක් පවත්වා ගැනීමට හැකියාව තිබූ බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඉහත සඳහන් සංචිත සඳහා සහල් තොග පවත්වාගෙන යාමට සකස් කරනු ලබන සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2783/2022

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ ආරම්භ කළ කිළිනොච්චි දිස්ත්‍රික් මහජන ක්‍රීඩාංගණය ඉදිකිරීම මේ වනතෙක් සම්පූර්ණ කර නොමැති බවත්;

(ii) 2019.03.07 වන දින එහි ගෘහස්ථ ක්‍රීඩාංගණය සහ පිහිණුම් තටාකය විවෘත කළ බවත්;

(iii) මේ වනතෙක් ඒවා භාවිතය සඳහා ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම මහජන ක්‍රීඩාංගණය —

(i) ඉදිකිරීමට වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) ඉදිකිරීමේදී මේ වනතෙක් භාවිතා කර ඇති මුදල කොපමණද;

(iii) ඉදිකරනු ලබන කොන්ත්‍රාත්කරුවන්ගේ විස්තර කවරේද;

(iv) ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර නොතිබේ නම්, ඊට හේතු කවරේද;

(v) ඉදිකිරීමට දැව වෙනුවට රබර් පලස් භාවිතා කිරීමට හේතු කවරේද;

(vi) ඉදිකිරීම් අවසන් කර භාවිතය සඳහා ලබා දෙනු ලබන දිනය කවරේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ක්‍රීඩාංගණය ඉදිකරනු ලබන ඉඩමේ හිමිකරුවන් කවරේද;

(ii) එය ඉදිකිරීමේදී, එම ඉඩම් හිමිකරුවන්ගෙන් අවසර ලබා ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසු එම ක්‍රීඩාංගණය පරිපාලනය කරනු ලබන්නේ කවුරුන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

2837/2022

ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ —

(i) පදිංචිව සිටින නිවාස අවශ්‍යතා සහිත පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) පෞද්ගලික ඉඩම්වල අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) ආදර්ශ ගම්මාන වශයෙන් ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 මැයි 19 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

8/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ මාධ්‍ය පාලනය කිරීම සඳහා නව නීති පැනවීමට අදහස් කර තිබේද;

(ii) අධිකරණ අමාත්‍යවරයා විසින් සිංගප්පූරු රජය සමඟ මේ පිළිබඳ සාකච්ඡාවක් පවත්වා ඇති බව පිළිගන්නේද;

(iii) සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

41/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්වභාවිකව වැවෙන මිනිස් ආහාරයට සුදුසු බිම්මල් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම බිම්මල් වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) ඒ අතරින් ඒකදේශික බිම්මල් වර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ස්වයං රැකියාවක් ලෙස බිම්මල් වගා කරනු ලබන වගාකරුවන්ට අවශ්‍ය බීජ ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) ඒ සඳහා වර්ෂයකට වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) දේශීය බිම්මල් බීජ, වගාකරුවන් අතර ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බිම්මල් වගාකරුවන්ට රජය සහන ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2971/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය, ඉරණවිල ග්‍රාමයේ ජීවත්වන ධීවර පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානයේ ජනතාව භාවිතා කරනු ලබන ධීවර තොටුපළ මේ වනවිට දැඩි මුහුදු ඛාදනයකට ලක්වී ඇති බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් පීඩාවට පත්ව සිටින ජනතාවගේ එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3086/2022

ගරු තවරාජා කලෙයි අරසන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ නගරය සහ ගල්ඔය ජනපදය සම්බන්ධ කරමින් කිට්ටංගිය ගඟ හරහා පිහිටා ඇති ප්‍රධාන මාර්ගය මෝසම් වැසි කාලයේදී අඩි පහකට වඩා ජලයෙන් යට වීම හේතුවෙන් එම මාර්ගය භාවිතා කරන ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලබන බවත්;

(ii) එම මාර්ගය ඔස්සේ අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක වෙත විශාල ලෙස ජනතාව ගමන් කරනු ලබන බවත්,

(iii) කිට්ටංගිය ගඟ හරහා පාලමක් ඉදිකර නොමැතිවීම හේතුවෙන් එම මාර්ගය භාවිතා කරන ළදුව අනතුරුවලට මුහුණදීම හේතුවෙන් පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් මියගිය අතර දේපළ ද විනාශ වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ කිට්ටංගිය ගඟ හරහා මේ දක්වා පාලමක් ඉදිනොකිරීමට හේතුව;

(ii) ඉහත සඳහන් පාලම ඉදිකරනු ලබන දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3156/2022

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා විමර්ශන නිලධාරින් 200ක් බඳවාගැනීමට 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවූ බවත්;

(ii) 2018.10.27 වන දින පවත්වන ලද බඳවාගැනීමේ විභාගයට අයදුම්කරුවන් 10,000ක් පමණ පෙනී සිටි බවත්;

(iii) විභාග ගාස්තු වශයෙන් එක් අයදුම්කරුවකුගෙන් රු.750/- ක් අය කරන ලද බවත්;

(iv) විභාගයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 408 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ බවත්;

(v) සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 200 දෙනෙකුගේ ආරක්ෂණ නිෂ්කාශන වාර්තා ලබා ගෙන ඇතද මේ දක්වා ඔවුන් බඳවාගෙන නොමැති බවත්;

(vi) ඉහත බඳවාගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර මේ වනවිට වර්ෂ 2කට අධික කාලයක් සහ එම බඳවාගැනීමට අදාළ වන කටයුතු අවසන් කර වර්ෂ 1 1/2ක පමණ කාලයක් ගත වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විමර්ශන නිලධාරින් කඩිනමින් බඳවාගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3157/2022

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1980 සිට මේ දක්වා විදේශීය රටක පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් ද්විත්ව පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් පිළිබඳ තොරතුරු තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) ශ්‍රී ලාංකිකයෙකු විදේශීය රටක පුරවැසිභාවය ලබා ගැනීමේදී ශ්‍රී ලංකාවේ රජය දැනුම්වත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1989 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ලද විදේශීය රටක පුරවැසිභාවය පමණක් හිමිව තිබූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) වර්ෂ 1989 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ලද ද්විත්ව පුරවැසිභාවය හිමිව තිබූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3174/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත තංගල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත වුවද, එම සමිතියේ බලය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගෙන තිබෙන බවත්;

(ii) තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු මෙයට සම්බන්ධ වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශනයක් සිදු කර තිබේද;

(ii) පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් (දකුණු පළාත) විසින් මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) සීමාසහිත තංගල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ සාමාජිකයන්ගේ සහ එහි ගනුදෙනුකරුවන්ගේ මුදල්වලට වගකියනු ලබන පාර්ශ්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3290/2022

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) චුන්නාගම් තැපැල් කාර්යාලය සහ තැපැල් ස්ථානාධිපති නිල නිවස ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇති බව එවකට යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දන්වා තිබුණද, එම ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති බවත්;

(ii) ඊට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෝෂ සහිත බව ජාතික විගණන කාර්යාලය විසින් පෙන්වා දී ඇති බවත්;

(iii) ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමෙන් ඉහත ව්‍යාපෘතිය නවතා දමන බව වත්මන් දිස්ත්‍රික් ලේකම් විසින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබුණද එය නිවැරදි නොවන බවත්;

(iv) ඉහත ඉදිකිරීම් අවසන් නොකිරීම හේතුවෙන් සිදු වූ පාඩුව, අත්තිකාරම් මුදලෙන් අඩු නොකළ මුදල හා ප්‍රමාදය සඳහා අය කළ යුතු දඩ මුදලෙන් කොටසක් පමණක් අය කිරීම සම්බන්ධයෙන් කිසිදු වාර්තාවක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කවරේද;

(ii) නොඑසේ නම්, ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

(iii) සැලසුම් කළ පරිදි ඉහත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3292/2022

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමටගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1970 වන තෙක් ක්‍රියාත්මකව පැවති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි කින්නියා සංචාරක අධිකරණය, උතුරු නැගෙනහිර පළාත්වල පැවති යුදමය වාතාවරණය හේතුවෙන් තාවකාලිකව වසා දැමූ බවත්;

(ii) ස්ථිර ගොඩනැගිලි ඉදිකරන තෙක් එම අධිකරණ කටයුතු රජයේ ගොඩනැගිල්ලක තාවකාලිකව නැවත ආරම්භ කිරීමට පසුගිය වර්ෂයේදී පියවර ගනු ලැබූවද මේ වන තෙක් එම අධිකරණයේ කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය අධිකරණයේ ගොනු වන නඩු සංඛ්‍යාව අවම කිරීම සඳහා සහ කින්නියා ප්‍රදේශයේ ජනතාව නඩු කටයුතු වෙනුවෙන් ත්‍රිකුණාමලය වෙත යාමේදී ඇති වන දුෂ්කරතා අවම කිරීම සඳහා කින්නියා සංචාරක අධිකරණය නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3336/2022

ගරු අලි සබ්රි රහීම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේ දී පුත්තලම දිස්ත්‍රික්කයේ ගංවතුර තත්ත්වයක් ඇති වූ බවත්;

(ii) එම ගංවතුර හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම පුත්තලම නගරයේ ඉස්සන් ගොවිපළ සහ ලුණු ලේවායන් හානියට පත් වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ගංවතුර හේතුවෙන් විපතට පත්වූවන්ට වන්දි ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) ඉදිරියේදී මෙවැනි ගංවතුර තත්ත්වයන් ඇති වීම වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2022 මැයි 20 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

253/2022

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ බිත්තර අපනයනය කරනු ලැබුවේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) ඉහත කාලය තුළ බිත්තර ආනයනය කරනු ලැබුවේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

573/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුකුළු පැටව් ජනිත කරවීම සඳහා වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද මව් සතුන් සංඛ්‍යාව;

(ii) එම මව් සතුන් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මව් සතුන් ආනයනය කිරීම සම්බන්ධයෙන් යම් සීමාවක් පැනවීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපාන ලද සාධක කවරේද;

(iii) එම සීමා කිරීම, ශ්‍රී ලංකාවේ බිත්තර මිල හා කුකුළු මස් මිල කෙරෙහි ඇති කරනු ලබන බලපෑම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1185/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත හේවාගම් කෝරළයේ හංවැල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ විශාල මුදල් වංචාවක් සිදු වී ඇති බවත්;

(ii) ප්‍රදේශයේ විහාරස්ථානවල හා සාමාන්‍ය ජනතාවගේ මුදල් එම සමූපකාර සමිතියට අනුබද්ධ ග්‍රාමීය බැංකුවල තැන්පත් කර ඇති බවත්;

(iii) එම තැන්පත්කරුවන්ට කිසිදු මුදලක් නැවත ලබා ගැනීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සමිතිය විසින් වංචා කර ඇති මුදල කොපමණද;

(ii) තම මුදල් ලබාගැනීමට නොහැකි වූ තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වංචාව සිදු කර ඇති ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම වංචාවට වගකිව යුතු අය හඳුනාගෙන තිබේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මුදල් වංචාවට ඉහත සමිතියේ එවකට අධ්‍යක්ෂ මණ්ඩලය, සමූපකාර දෙපාර්තමේන්තු නිලධාරින් හා පෞද්ගලික සමාගමක් වගකිව යුතු බව දන්නේද;

(ii) ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේ නම්, ඒවා කවරේද;

(iii) ඔවුන්ගෙන් මුදල් අයකර තැන්පතුකරුවන්ට සහන සැලසීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1187/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට ඉදිකරමින් පවතින කණු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ඇස්තමේන්තු මුදල කොපමණද;

(ii) එම මාර්ගයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) ඒ සඳහා අරමුදල් සපයා ගනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(iv) ඒ සඳහා අරමුදල් සපයන ලද ආයතන කවරේද;

(v) එම මාර්ගයේ ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1313/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැළණි ගඟ ආශ්‍රිතව ස්ථාපිත කර ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලාවලින් ඉවතලන අපවිත්‍ර ජලය එම ගඟට එක්කරනු ලබන බව දන්නේද;

(iii) එම අපවිත්‍ර ජලය හේතුවෙන් කැළණි ගං ජලයට සිදු වන හානිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) අපවිත්‍ර ජලය කැළණි ගඟට මුදා හැරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1473/2022

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර-ඇතුළු නුවර පදිංචි වී සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට මේ දක්වා නීත්‍යානුකූල පදිංචිය ලබා දී නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන්ට නීත්‍යානුකූල පදිංචිය ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1732/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මේ වනවිට වාර්තා වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වකුගඩු රෝගීන් අතරින් මාසික වකුගඩු රෝගී දීමනාව ලබා දෙනු ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත දීමනාව ලබා ගැනීම පිණිස පොරොත්තු ලේඛනයේ සිටින රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) පොරොත්තු ලේඛනයේ සිටින වකුගඩු රෝගීන්ට ඉහත දීමනාව කඩිනමින් ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1948/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පේරාදෙණිය, ගන්නොරුව ප්‍රදේශයේ මහවැලි ගඟ හරහා ඉදිකර ඇති සංගිලි පාලම අසල පේරාදෙණිය උද්භිද උද්‍යානයට ප්‍රතිවිරුද්ධ දිශාවට මුහුණලා මහවැලි ගඟ ආක්‍රමණය කර අනවසර හෝටලයක් ඉදිකරමින් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම අනවසර ඉදිකිරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහනුවර, අනිවත්ත ප්‍රදේශයේ දොඩංවල නව පාලමට වම්පස පිහිටා ඇති (අනිවත්ත සිට හල්ඔළුව මාර්ගයට පිවිසෙන විට) මහවැලි ගඟ රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් විශාල සංඛ්‍යාවක් සිදු කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) අනවසර ඉදිකිරීම් වැළැක්වීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1960/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,—ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1995/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය සමයේදී මහපොළ භාරකාර අරමුදලේ රැස්වීම්වල කාර්ය සටහන් ක්‍රමවත්ව පවත්වාගෙන ගොස් නොමැති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් රජයේ මුදල් වංචා කිරීමට අවස්ථාව සැලසී තිබේද;

(iii) එසේ නම්, එලෙස වංචා කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහපොළ භාරකාර අරමුදල වාර්ෂිකව විගණනය කර නොමැති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් රජයේ මුදල් වංචා කිරීමට අවස්ථාව සැකසී තිබේද;

(iii) එසේ නම්, එලෙස වංචා කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මහපොළ භාරකාර අරමුදලේ අනුමතිය නොමැතිව එම අරමුදලට සම්බන්ධතාවයක් නොමැති ගිවිසුම් අත්සන් කර ඇති බව දන්නේද;

(ii) එමඟින් මහපොළ භාරකාර අරමුදලේ මුදල් වංචාකර තිබේද;

(iii) එසේ නම්, එලෙස වංචා කරන ලද මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?